සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
## ஆண்டிறுதி மதிப்பீடு - 2018
## Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) මහාවංශයට ලියන ලද ටීකාව ලෙස සැලකෙනුයේ පහත කුමන කෘතිය ද?

(1) විනයට්ඨ කථා　　(2) වංසත්ථප්පකාසිනි

(3) උත්තර විහාරට්ඨකථා　　(4) දීපවංශය

(02) පොළොන්නරු රාජ්‍ය සමයේ දී මෙරට භාවිතා වූ කාසි වර්ගයකට උදාහරණයකි.

(1) කහාපණ කාසි　　(2) ධරණ කාසි

(3) තඹ මස්ස　　(4) ස්වස්තික කාසි

(03) ඉතිහාසය හැදෑරීමේ දී පුරාවිද්‍යාත්මක ස්මාරක වැදගත්වීමට හේතුවක් වන්නේ,

(1) පැරණි ජනතාවගේ නිර්මාණාත්මක හැකියාව, වාස්තු විද්‍යාව නිරූපණය වන නිසා ය.

(2) ආදී ජනතාවගේ ඇඳුම් පැළඳුම්, ආහාරපාන සහ ආභරණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළහැකි නිසා ය.

(3) ඓතිහාසික තොරතුරු කාල අනුපිළිවෙළට සකස් කර ගැනීමට හැකි නිසා ය.

(4) රටක විදේශීය සබඳතා අධ්‍යයනය කිරීමට මේවා වැදගත් වන නිසා ය.

(04) පහත "අ" තීරුව හා "ආ" තීරුව නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරා ඉරක් අඳින්න.

| "අ" | "ආ" |
|---|---|
| 1. රිබෙයිරෝ | A. ඉංග්‍රීසි ජාතිකයෙකි. |
| 2. පාහියන් හිමි | B. පෘතුගීසි ජාතිකයෙකි. |
| 3. රොබට් නොක්ස් | C. ග්‍රීක ජාතිකයෙකි. |
| 4. ඇරිස්ටෝටල් | D. චීන ජාතිකයෙකි. |

(1) BCDA　　(2) CDBA　　(3) CBDA　　(4) BDAC

(05) මිනිහාගල්කන්ද, බූන්දල, අලුගල්ගේ යන ප්‍රාග් ඓතිහාසික ස්ථාන අයත් වන්නේ කුමන පරිසර කලාපයට ද?

(1) පහතරට වියළි කලාපයට ය.

(2) පහතරට අතරමැදි වියළි කලාපයට ය.

(3) පහතරට තෙත් කලාපයට ය.

(4) අර්ධ ශුෂ්ක කලාපයට ය.

(06) තම පවුලේ සාමාජිකයකු හෝ තම ඥාතියකු හෝ මිය ගිය පසු වාසය කළ ගල්ගුහාව තුළ වළ දැමීමේ සිරිතක් පැවතියේ,

(1) මුල් ඓතිහාසික යුගයේ දී ය.
(2) ප්‍රාග් ඓතිහාසික යුගයේ දී ය.
(3) පූර්ව ඓතිහාසික යුගයේ දී ය.
(4) මධ්‍යතන යුගයේ දී ය.

(07) ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ප්‍රජාව ජීවත් වූ තැන වපසරිය වර්ග මීටර් 120කි. එතැනින් මිනි ඇටසැකිලි 30ක් සොයා ගෙන ඇත. එම ස්ථානය පහත පිළිතුරු අතුරෙන් තෝරන්න.

(1) සීගිරියේ පොතාන
(2) කිතුල්ගල බෙලිලෙන
(3) බෙල්ලන්බැඳිපැලැස්ස
(4) පාහියන්ගල

(08) ශ්‍රී ලංකාවේ පැවති පූර්ව ඓතිහාසික යුගය ඊට පෙර පැවති ප්‍රාග් ඓතිහාසික යුගයෙන් වෙන් වී පෙනීමට පදනම් වූ සාක්ෂියක් නොවන්නේ,

(1) ගල් මෙවලම් භාවිතා කිරීම.
(2) පිලිස්සූ මැටි වළං භාවිතය.
(3) කෘෂිකර්මාන්තය ඇරඹීම.
(4) ස්ථිර ජනාවාස ඉදිකිරීමට ආරම්භ කිරීම.

(09) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයේ විසූ මානවයාගේ ජීවන රටාව පිළිබඳ තොරතුරු ලබා ගැනීමට ඉවහල් වන සාධක රැසක් ලැබී ඇති ස්ථානයක් ලෙස සැලකෙනුයේ,

(1) මාංතොට
(2) රංචාමඩම
(3) කදුරුගොඩ
(4) පාහියංගල

(10) මුල් ඓතිහාසික යුගයේ ශ්‍රී ලංකාවේ ජනාවාසවල ව්‍යාප්තිය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට වැදගත් වන සාධකය පහත පිළිතුරු අතුරෙන් තෝරන්න.

(1) ගල්ගුහාවල පිහිටීම
(2) ගම් වැව්වල ව්‍යාප්තිය
(3) ස්වභාවික සම්පත්වල ව්‍යාප්තිය
(4) තැනිතලා බිම්වල ව්‍යාප්තිය

(11) ගංගා නිම්නවල පිටතින් ආරම්භවන මුල් ඓතිහාසික ජනාවාස පසු කාලයේ දී ගංගා නිම්නය තුළට අවතීර්ණ වන ආකාරය පිළිබඳ පැහැදිලි අදහසක් ඉදිරිපත් කර ඇත්තේ,

(1) මහවැලි ගංගා නිම්නයේ සිදුකර ඇති අධ්‍යයනයෙනි.
(2) කිරිඳි ඔය නිම්නයේ සිදු කර ඇති අධ්‍යයනයෙනි.
(3) වළවේ නිම්නයේ සිදුකර ඇති අධ්‍යයනයෙනි.
(4) මල්වතු ඔය නිම්නයේ සිදුකර ඇති අධ්‍යයනයෙනි.

(12) පැරණි ගමක ජීවත් වූ දිළිඳු වැසියකු ඊළඟ කන්නයේ ලබාදෙන පොරොන්දුව පිට ඒ ගමේ විසූ ගමිකයාගෙන් වී මල්ලක් ඉල්ලාගත් පුවතක් සඳහන් වන්නේ,

(1) ජාතකට්ඨකථාවේ ය.
(2) සද්ධර්මරත්නාවලියේ ය.
(3) පූජාවලියේ ය.
(4) රාජාවලියේ ය.

(13) අන්තර්ජාතික කලාපීය අවශ්‍යතාවකට මුහුණ දීම සඳහා මහ වැව් ඉදිකිරීමට පුරෝගාමී වූයේ,

(1) මහසෙන් රජතුමා ය.
(2) මහා පරාක්‍රමබාහු රජතුමා ය.
(3) වසභ රජතුමා ය.
(4) ධාතුසේන රජතුමා ය.

(14) විමධ්‍යගත පාලන [illegible] සිටි පරුමකවරුන් මධ්‍යගත පාලනයට සම්බන්ධකර ගැනීමෙන් කේන්ද්‍රීය රාජ්‍ය පාලනයක් ඇති කළ රජතුමා

(1) පණ්ඩුකාභය (2) දුටුගැමුණු (3) I විජයබාහු (4) සද්ධාතිස්ස

(15) "භාෂා හා ආගම් අතින් වෙනස් වුව ද, අසල්වාසී රටවල ප්‍රජාව සමඟ විශ්වාසවන්ත ලෙස කටයුතු කිරීම අපේ පැරණි පාලකයන්ගේ විදේශ ප්‍රතිපත්තියේ කැපී පෙනෙන ලක්ෂණයකි." ඉහත ප්‍රකාශයට පටහැනි පිළිතුර කුමක් ද?

(1) I විජයබාහු රජතුමා දළදා මාළිගාවේ ආරක්ෂාවට වේලයික්කාර හමුදාවට පැවරීම ය.

(2) I පරාක්‍රමබාහු රජු වෙළෙඳ ගනුදෙනුවක් මුල් කර ගෙන බුරුමය ආක්‍රමණය කිරීම.

(3) භාතිකාභය රජු රෝමය සමඟ රාජතාන්ත්‍රික සබඳතා පැවැත් වීම ය.

(4) VI වන අග්ගබෝධි රජ චීනය සමඟ රාජතාන්ත්‍රික සබඳතා පැවැත්වීම ය.

(16) රජරට ශිෂ්ටාචාර සමයේ ලියවුණු බොහෝ කවිවල තේමාව වී ඇත්තේ ලෝකයේ පවතින අනිත්‍යතාවයයි. එසේ වීමට හේතුව ලෙස සැලකිය හැක්කේ,

(1) සෙල්ලිපි බොහොමයක් පන්සල් ආශ්‍රිතව ස්ථානගත කර තිබීමයි.

(2) භික්ෂූන් වහන්සේලා විසින් අධ්‍යාපනය ලබාදීමයි.

(3) ජාතක කථා ආශ්‍රයෙන් කවි ලිවීමට පෙළඹීමයි.

(4) බුදු දහමින් ලද හික්මීමත්. ස්වභාව ධර්මය සමඟ කටයුතු කිරීමත් ය.

(17) ක්‍රි.ව. 850 දී ශ්‍රී පාදය වන්දනා කිරීමට පැමිණි දේශ ගවේෂකයා වූයේ,

(1) සුලෙයිමාන් ය. (2) ඉබන් බතූතා ය.

(3) ෆාහියන් හිමියන් ය. (4) හියුත්සාං හිමියන් ය.

(18) අඹන් ගඟ හරස් කර බැම්මක් බැද වැව් ගණනාවකට ජලය ගෙන යාමට නිර්මාණය කළ ඇළ මාර්ගය වන්නේ,

(1) යෝධ ඇළ (2) ඇළහැර ඇළ

(3) මිනිපේ ඇළ (4) අංගමැඩිල්ල ඇළ

(19) වැවක බැම්මේ පහළම මට්ටමේ පිහිටුවා ඇති වර්ෂා කාලයෙන් පසුව වැවේ එක් රැස්වන රොන් මඩ ඉවත් කිරීමට යොදාගන්නේ වැවක කුමන අංගයක් ද?

(1) දියකැට පහන (2) මඩ සොරොව්ව

(3) බිසෝ කොටුව (4) ගොඩ සොරොව්ව

(20) සංකීර්ණ භෞතික විද්‍යාත්මක මූලධර්ම පිළිබඳ දැනුම පැරණි ලාංකික ඉංජිනේරුවන් සතුව පැවති බව සනාථ කිරීමට ඉදිරිපත් කළ හැකි හොඳම උදාහරණයක් වන්නේ,

(1) ඉබ්බන්කටුව මහාශිලා සුසාන (2) රංචාමඩම මැටි බඳුන

(3) සකපෝරුව (4) දැදිගම සූතිඝර චෛත්‍යය

(21) පහත "අ" තීරුවේ දැක්වෙන ඓතිහාසික තොරතුරු සඳහා යොදා ලද හැඳින්වීම් "ආ" තීරුවේ නාම හා ගැළපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

| "අ" තීරුව | "ආ" තීරුව |
|---|---|
| 1. පළමුවන විජයබාහු රජතුමාගේ පනාකඩුව තඹ සන්නසේ අනුරාධපුරය නම් කර ඇත්තේ | A - දසගම් ඇත්තන් |
| 2. බ්‍රාහ්මිය සෙල්ලිපිවල "අවරණ" යන පදය යොදා ඇත්තේ | B - නුරුපුරු |
| 3. වැටකින් ආරක්ෂා වූ ගම් හැඳින්වූ නාමය | C - පරිඛිත්ත ගම් |
| 4. ගම් ප්‍රධානීන් දස දෙනෙකුගෙන් යුත් මණ්ඩලය | D - අමුණ |

(1) BDCA (2) BDAC (3) CDAC (4) ACDB

(22) පහත සඳහන් ප්‍රකාශ අතරින් දේශීය වෙළඳාම සම්බන්ධ වන ප්‍රකාශ තෝරන්න.

A - සීගිරියේ බටහිර ජල උද්‍යානයේ සෙල්ලිපියක "වාපර" නමින් සියඹලා වෙළෙන්දෙකු හඳුන්වා තිබීම.

B - නානාදේසීන්ට අයත් මුද්‍රාවක් හම්බන්තොටින් සොයා ගෙන තිබීම

C - සොරබොර වැව වැම් ලිපියේ හෝපිටිගමුව වෙළෙඳපළක් ගැන සඳහන් වීම

D - බොවත්තේගල නම් ස්ථානයේ සෙල්ලිපියක කාම්බෝජවරුන්ගේ මහා වෙළෙඳ සංවිධානයක් ගැන සඳහන් වීම

(1) A හා D (2) B හා C (3) A හා C (4) B හා D

(23) අභයගිරි කැනීම්වලින් සොයා ගන්නා ලද වර්ණලිප්ත උළුවලින් අපට නිගමනය කළ හැකි කරුණක් වන්නේ,

(1) පුරාණ කාලයේ විශාල වෙහෙර විහාර නිර්මාණය කළ බව ය.

(2) අතීතයේ මෙරට ඉතා දියුණු මැටි කර්මාන්තයක් පැවති බව ය.

(3) ගොඩනැගිලි සෑදීමේ ඉහළ දැනුමක් පැරැන්නන් තුළ පැවති බව ය.

(4) නූතන කොන්ක්‍රීට් තාක්ෂණයට සමාන ක්‍රමවේදයක් අතීතයේ අනුගමනය කළ බව ය.

(24) අතීතයේ ආහාර ලෙස ගත් සාලි, වීහි, කැදෑස, වරක, කංගු, දූම යනු,

(1) කැඳ වර්ගයන් ය. (2) ධාන්‍ය වර්ගයන් ය.

(3) සහල් වර්ගයන් ය. (4) අතුරුපස වර්ගයන් ය.

පහත දක්වා ඇති රජවරු පිළිබඳ අධ්‍යයනය කර 25, 26, 27 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | |
|---|---|
| A - තුන්වන විජයබාහු | B - දෙවන බුවනෙකබාහු |
| C - සවුළු විජයබාහු | D - හයවන පරාක්‍රමබාහු |
| E - දෙවන පරාක්‍රමබාහු | F - පළමුවන බුවනෙකබාහු |

(25) ඉහත දක්වා ඇති රජවරුන් අතරින් සාහිත්‍ය දියුණුවට අනුග්‍රහය දැක්වූ රජවරු දෙදෙනකු අයත් පිළිතුර තෝරන්න.

(1) D හා E (2) A හා D (3) E හා F (4) B හා C

(26) කුරුණෑගල රාජධානියේ රජ කළ රජවරුන් දෙදෙනෙක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) A හා D (2) D හා F (3) E හා D (4) B හා C

(27) රටේ ආරක්ෂාව වෙනුවෙන් ද, තමබල ප්‍රදේශය ආරක්ෂා කර ගැනීම සඳහා අගනුවරවල් තෝරාගත් රජවරුන් දෙදෙනෙක් තෝරන්න.

(1) C හා F (2) B හා D (3) E හා F (4) A හා B

(28) රජරට රාජධානි බිඳවැටීමෙන් පසු අපේ අතීත මුතුන් මිත්තන් මහවැව් තැනීමට අවධානය යොමු නොකිරීමට බලපෑ ප්‍රධාන හේතුව වන්නේ,

(1) ගිරි දුර්ග ආශ්‍රිතව තම රාජධානි පිහිටුවා ගැනීම ය.

(2) විදේශීය වෙළෙඳාම වර්ධනය වීම ය.

(3) තෙත් කලාපයේ ජනාවාස පිහිටුවා ගැනීම නිසා වර්ෂාව නොඅඩුව ලැබීම ය.

(4) ප්‍රධාන ජීවනෝපාය වැවිලි ආර්ථිකය වීම ය.

පහත වගුවේ දක්වා ඇති තොරතුරු ඇසුරෙන් 29, 30 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| වර්ෂය | රජවරු | සිදුවීම |
|---|---|---|
| A. 1630 | D. රාජාධිරාජසිංහ | G. උඩරට ගිවිසුම |
| B. 1796 | E. ශ්‍රී වික්‍රම රාජසිංහ | H. රන්දෙනිවල |
| C. 1815 | F. සෙනරත් රජු | I. ඉංග්‍රීසීන් ලංකාවේ වෙරළබඩ ප්‍රදේශ අල්ලා ගැනීම |

(29) පෘතුගීසීන් වටකොට උඩරටියන් එල්ල කළ ප්‍රහාර නිසා අන්ත අසරණ තත්ත්වයට පත් වූ අවස්ථාවක් වන්නේ,

(1) AFH (2) CFE (3) BEI (4) AEI

(30) උඩරට රාජධානිය යටත්වීම සම්බන්ධ සිදුවීම අඩංගු පිළිතුර මින් කුමක් ද?

(1) AEH (2) CEG (3) CDI (4) BEG

(31) මහනුවර රාජධානි සමයේ රජවාසල ප්‍රයෝජනය සඳහා වෙන්වූ ඉඩම් පහත කිනම් නමකින් හැඳින්වේ ද?

(1) ගබඩාගම් (2) නින්දගම් (3) විහාරගම් (4) පරවේණිගම්

(32) අදිකාරම්වරුන්ගේ ආඥා හෝ පණිවිඩ ප්‍රාදේශීය නිලධාරීන් කරා ගෙන ගිය පිරිස හැඳින්වූයේ,

(1) රටේ රාල (2) උණ්ඩිය රාල

(3) කටුපුල්ලේ පණිවිඩකරුවන් (4) ලියනරාල

(33) A - 1526 දී විජයබාකොල්ලය සිදුවීම

B - කෝට්ටේ රාජ්‍ය කොටස් තුනකට බෙදිනි.

ඉහත ප්‍රකාශවලින්

(1) A හා B අසත්‍ය වේ. (2) A සත්‍ය වන අතර B අසත්‍ය වේ.

(3) A පමණක් සත්‍ය වේ. (4) B පමණක් සත්‍ය වේ.

(34) පහත දැක්වෙන ප්‍රකාශ අතරින් උඩරට හා පෘතුගීසීන් අතර වූ සම්බන්ධතා පිළිබඳව සත්‍ය ප්‍රකාශ දෙක ඇතුළත් පිළිතුර කුමක් ද?

A - පෘතුගීසීහු උඩරට ආක්‍රමණ සියල්ල ජයගත්හ.

B - පෘතුගීසීන් උඩරට රජවරුන් සමඟ මිත්‍රශීලීව කටයුතු කිරීම

C - උඩරට ප්‍රදේශවල පාලන බලයක් ලබා ගැනීමට පෘතුගීසීහු අසමත් වූහ.

D - උඩරට සමඟ පෘතුගීසි සබඳතාව ආක්‍රමණශීලී එකක් විය.

(1) A හා B (2) C හා D (3) B හා D (4) A හා D

(35) ලන්දේසීන්ගේ පෙරදිග පාලන මධ්‍යස්ථානය වූයේ,

(1) මදුරාසිය (2) පොන්ඩිචෙරි (3) ගෝව (4) බතාවිය

(36) යුරෝපීය පුනරුද සමයේ දියුණුවට පත් වූ ක්ෂේත්‍ර කිහිපයක් හා සම්බන්ධ පුද්ගලයන්ගේ නම් "අ" තීරුවේ ද, ඔවුන් ප්‍රසිද්ධියට පත් ක්ෂේත්‍ර "ආ" තීරුවේ ද දැක්වේ. තීරු දෙක නිවැරදිව ගැලපූවිට ලැබෙන පිළිතුර තෝරන්න.

| "අ" තීරුව | "ආ" තීරුව |
|---|---|
| 1. කොළොම්බස් | A - ලෝරාට සැහැලිකවි |
| 2. පෙට්රාක් | B - දුරදක්නය |
| 3. ගැලිලියෝ ගැලිලි | C - දේශගවේෂණය |
| 4. කැබේ සහෝදරයෝ | D - කැනඩාව |

(1) CABD (2) ABDA (3) DBCA (4) ABCD

(37) පුනරුද සමයේ දේශපාලන ක්ෂේත්‍රයේ සිදුවූ වැදගත්ම වෙනස කුමක් ද?

(1) වැඩවසම් සමාජ ක්‍රමයක් ඇතිවීම
(2) ජාතික රාජ්‍ය බිහිවීම
(3) වංශාධිපතිවරුන් බලවත් වීම
(4) රජුගේ බලතල අඩුවීම

(38) පෘතුගීසීන් මෙරට මුහුදුබඩ ප්‍රදේශවල ව්‍යාප්ත කළ ආගම පහත පිළිතුරු අතුරෙන් තෝරන්න.

(1) රෙපරාමාදු ආගම
(2) ඉස්ලාම් ආගම
(3) රෝමානු කතෝලික ආගම
(4) හින්දු ආගම

(39) පහළොස්වන සියවසේ දි කොන්ස්තන්තිනෝපලය වැදගත් වූයේ කවර හේතූන් නිසා ද?

(1) ක්‍රිස්තුස්වහන්සේගේ උත්පත්තිය සිදුවූ ශුද්ධ භූමිය නිසා ය.
(2) පෙර අපර දෙදිග ප්‍රධාන වෙළඳ මධ්‍යස්ථානය නිසා ය.
(3) නාවුක යුද්ධ අභ්‍යාස ආයතනයක් පිහිටි නිසා ය.
(4) බටහිර රෝම අධිරාජ්‍යයේ අගනුවර නිසා ය.

(40) යුරෝපීය පුනරුදය මුලින් ම ආරම්භ වූ ඉතාලි නගරය කුමක් ද?

(1) රෝමය.
(2) මිලාන්.
(3) වැනීසිය.
(4) ෆ්ලොරන්ස්.

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

82495

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
# ஆண்டிறுதி மதிப்பீடு - 2018
# Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 03 |

සැලකිය යුතුයි:
- I කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට ද, III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක සිතියමෙහිද ලකුණු කර නම් කරන්න.

(i) මහනුවර, වළවේ ගඟ, යාපනය, නාච්චදූව වැව, මහාතිත්ථ, පල්ලවවංක, දැදුරු ඔය, ඉබ්බන්කටුව, සීතාවක, මාගම, ගාල්ල, පරාක්‍රම සමුද්‍රය (ලකුණු 12)

(ii) කොන්ස්තන්තිනෝපල් නගරය, ඉතාලිය, චීනය, පර්සියන් බොක්ක, අරාබි මුහුද, ගෝව (ලකුණු 06)

(ආ) (i) පහත A, B, C, D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයින් කවුරුන්දැයි අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය කෘතියේ කතුවරයා

B - ක්‍රිස්තුස් වහන්සේගේ අන්තිම භෝජන සංග්‍රහය කාගේ නිර්මාණයක් ද?

C - ශ්‍රී ලංකාව "රතු කැට දිවයින" නමින් හැඳින්වූ අරාබි ජාතික ඉතිහාසඥයා

D - කලා වැව නිර්මාණය කරන ලද රජතුමා (ලකුණු 04)

- A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(ii) (1) A රූපයෙන් දැක්වෙන චිත්‍රයේ රජතුමා නම් කරන්න.

(2) මෙතුමා රජවීමට පෙර භාවිත කළ නම ලියන්න.

(3) මෙතුමා කිනම් රාජධානියක පාලකයා වීද?

(4) මෙම චිත්‍රය ඇඳින ලද්දේ කවුරුන් විසින් ද?

(ලකුණු 04)



A රූපය

(iii) (1) B රූපය නම් කරන්න.

(2) මෙම රූපය දක්නට ලැබෙන්නේ කුමන දේවස්ථානයක ද?

(3) එහි චිත්‍ර ඇඳින ලද පුද්ගලයකු නම් කරන්න.

(4) එය කුමන කාලයකට අයත්දැයි ලියන්න.

(ලකුණු 04)



B රූපය

## II කොටස

(02) (i) පහත A, B, C වලින් දක්වා ඇති පුද්ගලයෝ සෙල්ලිපිවල දක්වෙන්නේ කිනම් නමකින්දැයි අනුපිළිවෙළින් ලියන්න.

A - පවුලක ප්‍රධානියා B. ගමේ ප්‍රධානියා

C - තීර්ථය අනුභව කරන්නා (ලකුණු 03)

(ii) මුල් ඓතිහාසික යුගයේ පැවති වාපිගාම හතරකට උදාහරණ දෙන්න. (ලකුණු 04)

(iii) අතීත රජවරුන් ජනතා විශ්වාසය ගොඩනගා ගැනීමට රටවැසියාට ඉටුකළ කාර්යයයන් දෙකක් ලියා උදාහරණ දෙමින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) විමධ්‍යගතව පැවති දේශපාලන බලය මධ්‍යගත කිරීම සඳහා I විජයබාහු රජතුමා කළ කාර්යයන් තුනක් ලියා විස්තර කරන්න. (ලකුණු 06)

(03) (i) පහත A, B, C හි සඳහන් වන්නේ පැරණි ලේඛනවල සඳහන් වන්නේ කිනම් නමකින් දැයි ලියා දක්වන්න.

A. ගුරුවරු B. වෛද්‍යවරු C. නීති විශාරදයන් (ලකුණු 03)

(ii) ඈත අතීතයේ අපේ රටේ ජීවත් වූ විවිධ ජන කොටස් හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) පූර්ව ඓතිහාසික යුගයේ ජීවත් වූ වැසියන් තුළ තිබූ විද්‍යාත්මක හා සංස්කෘතික දැනුම කෙබඳු දැයි අවබෝධ කර ගැනීමට ඉදිරිපත් කළ හැකි සාක්ෂි දෙකක් ලියා විස්තර කරන්න. (ලකුණු 05)

(iv) ඉතා ඈත කාලයක සිට ජල කළමනාකරණයට අදාළව අපේ රටේ පැවති තාක්ෂණය පිළිබඳ නිර්මාණ තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(04) (i) පැරණි සෙල්ලිපිවල පහත සඳහන් අය හඳුන්වා ඇත්තේ කිනම් නම්වලින්දැයි අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A. රාජකීය නිලධාරීන් -

B. සාමාන්‍ය ජනතාව -

C. පාරම්පරික දාසයන් - (ලකුණු 03)

(ii) පහත දක්වා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු අනුපිළිවෙලින් සඳහන් කරන්න.

A. මෙරට භාවිතා වූ පැරණිම කාසිය -

B. කාසි අච්චු ගැසීම භාර නිලධාරියා -

C. වර්තමානයේ ශ්‍රී ලංකාවේ භාවිතාවන නීතිය -

D. අපරාධකරුවන් අල්ලා දෙනතුරු ගම්වැසියන් රජයට ගෙවිය යුතු බද්ද (ලකුණු 04)

(iii) පැරණි කාලයේ කාන්තාව සමාජයේ දැඩි බැඳීම්වලින් පීඩාවට ලක්නොවූ බව කරුණු දෙකක් ඇසුරින් පෙන්වන්න. (ලකුණු 05)

(iv) යහපත් සමාජයක් පවත්වාගෙන යාමට අපේ නැණවත් පාලකයෝ නීති සහ සම්ප්‍රදාය අනුව කටයුතු කළ බව කරුණු තුනක් යටතේ විස්තර කරන්න. (ලකුණු 06)

(05) (i) දෙවන නාගරීකරණ අවධියේ බිහි වූ පාලන මධ්‍යස්ථාන තුනක් යාබද ලංකා සිතියමේ A, B, C ලෙස දක්වා ඇත. ඒවා පිළිවෙළින් නම් කරන්න.




(ලකුණු 03)

(ii) පහත A, B, C, D වලට අදාළ නිවැරදි පිළිතුරු අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - තෙවන වික්‍රමබාහු රජුගේ ප්‍රධාන ඇමතිවරයා -

B - අටවන වීරපරාක්‍රම නමින් රජවූ කුමාරයා -

C - තම මෑණියන් සිහිවීමට පැපිලියානේ සුනේත්‍රා දේවි පිරිවෙන ඉදිකළ රජතුමා

D - යාපහුව කඳු මුදුනේ දුර්ගයක් පිහිටුවාගෙන සතුරන්ගෙන් එම ප්‍රදේශය ආරක්ෂා කරගත් සෙනෙවියා -

(ලකුණු 04)

(iii) පොළොන්නරු රාජධානිය බිඳ වැටීමට බලපෑ හේතු දෙකක් ලියා විස්තර කරන්න.

(ලකුණු 05)

(iv) දෙවන පරාක්‍රමබාහු රජතුමා මුහුණ දුන් අභියෝග තුනක් සඳහන් කර එතුමා ඒවා විසඳූ ආකාරය විස්තර කරන්න.

(ලකුණු 06)

(06) (i) පහත A, B, C හි සඳහන් සිද්ධීන් සම්බන්ධ පුද්ගලයින් කවුරුන්දැයි පිළිවෙළින් ලියා දක්වන්න.

A. උඩරට ප්‍රදේශ ආශ්‍රිතව මුල්වරට ස්වාධීන රාජධානියක් ගොඩනගන ලද රජතුමා -

B. දොන් පිලිප් නමින් පෘතුගීසීන් වෙතින් බෞතිස්ම ලැබූ කුමාරයා -

C. නායක්කර්වංශික රාජවංශයේ පළමු රජතුමා -

(ලකුණු 03)

(ii) I විමලධර්මසූරිය රජතුමා මුහුණදුන් අභියෝග හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) II රාජසිංහ රජතුමාගේ පාලන සමයේ දී එතුමා මුහුණ දුන් අභියෝග දෙකක් සඳහන් කර ඒවා විසඳාගත් ආකාරය විස්තර කරන්න.

(ලකුණු 05)

(iv) මහනුවර රාජධානියේ පරිපාලනය සංවිධානය වී තිබූ ආකාර තුනක් ලියා විස්තර කරන්න.

(ලකුණු 06)

(07) (i) යුරෝපීයන් ආසියාවට පැමිණීමේ අරමුණු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) ඈත අතීතයේ සිටම ආසියාව හා යුරෝපා අතර වෙළෙඳ සබඳතා පැවැත්වූ ප්‍රධාන මාර්ග දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 04)

(iii) ශ්‍රී ලංකාවෙන් උපරිම ආර්ථික වාසි ලබා ගැනීම සඳහා ලන්දේසීන් අනුගමනය කල ප්‍රතිපත්ති දෙකක් ලියා විස්තර කරන්න.

(ලකුණු 05)

(iv) උඩරට බලය ලබාගැනීමට පෘතුගීසීන් එල්ල කල සියලු ආක්‍රමණ අසාර්ථක වීමට මෙන්ම උඩරට රාජධානිය තවදුරටත් ආරක්ෂා වීමට බලපෑ හේතු දෙකක් ලියා විස්තර කරන්න.

(ලකුණු 06)

## III කොටස

(08) (i) පහත A, B, C හි හි සඳහන් ප්‍රකාශනවලට අදාළ නිවැරදි පිළිතුරු පිළිවෙළින් ලියා දක්වන්න.

A. මධ්‍යතන යුගය අවසාන භාගයේ ඉතා දියුණුව පැවති වෙළෙඳ නගරය -

B. නූතන තාරකා විද්‍යාවේ පියා ලෙස හැඳින්වෙන පෝලන්ත ජාතිකයා -

C. මුද්‍රණ කර්මාන්ත මෙරටට හඳුන්වා දුන් ජාතිය - (ලකුණු 03)

(ii) බ්‍රිතාන්‍යයන් විසින් මෙරට වගා කළ ආර්ථික බෝග හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) යුරෝපීය පුනරුදය ඇතිවීමට බලපෑ හේතු දෙකක් ලියා විස්තර කරන්න. (ලකුණු 05)

(iv) යුරෝපයේ ඇති වූ පුනරුදය ලංකාව කෙරෙහි බලපෑ ආකාරය පහත ක්ෂේත්‍ර තුන ඔස්සේ පැහැදිලි කරන්න.

(a) දේශපාලන (b) ආර්ථික (c) සංස්කෘතික (ලකුණු 06)

(09) (i) පුනරුද සමයේ කතෝලික සභාවේ ඇතැම් දුර්වලතා විවේචනය කළ තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත සඳහන් ඓතිහාසික තොරතුරුවලට අදාළ පිළිතුරු වරහන් තුළින් තෝරා A, B, C, D අනුපිළිවෙළින් ලියන්න.

A. අප්‍රිකාවේ කුණාටු තුඩුවට පැමිණි දේශගවේෂකයා -

B. මිනිස් සිරුරේ රුධිර සංසරණ පද්ධතිය පිළිබඳ තොරතුරු -

C. පිලිපීනය සොයා ගන්නා ලද්දේ -

D. ඩිවිනා කොමඩියා නම් නාට්‍ය ග්‍රන්ථය රචනා කළ කතුවරයා -

(අලගියරි ඩාන්ටේ, පර්ඩිනාන්ඩ් මැගලන්, පෙට්රාක්, විලියම් හාවේ, වස්කෝද ගාමා, බර්තොලමියුදියස්, විලියම් ෂෙක්ස්පියර්, ජොහැන්ස් ගුටන්බර්ග්)

(ලකුණු 04)

(iii) පුනරුද සමයේ සිදුවූ දේශපාලන හා ආර්ථික නවෝදය කරුණු දෙකක් යටතේ විස්තර කරන්න. (ලකුණු 05)

(iv) පුනරුද සමයේ පහත අංශ දෙකෙහි ප්‍රබෝධයක් හටගත් බව නිදසුන් දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

A. කලා ක්ෂේත්‍රය B. විද්‍යා ක්ෂේත්‍රය (ලකුණු 06)


N
ඉන්දියන් සාගරය
இந்து சமுத்திரம்
Indian Ocean
අප්‍රිකාව
ஆபிரிக்கா
Africa

(01) (අ) (i) ප්‍රශ්නය සඳහා

59277

